2 ඒකකය - ස්ථිති විද්‍යුතය(2)

✓ පෙළ පොත හෝ වෙනත් සුදුසු ඉගෙනුම් සම්පත් පරිශීලනයෙන් පහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න.

ක්‍රියාකාරකම 2.5

අවශ්‍ය ද්‍රව්‍ය :- 15 cm x 15 cm ප්‍රමාණයෙන් හෝ ඒ ආසන්න ප්‍රමාණයක තුනී ඇලුමිනියම් තහඩු දෙකක්, වයර කැබලි දෙකක්, ගැල්වනෝ මීටරයක්, පොලිතීන් කොළයක්, වියළි කෝෂ දෙකක්, සෙලොටේප් හෝ රබර් පටි

ක්‍රමය :-

- ඇලුමිනියම් තහඩු දෙකට වයර් කැබලි දෙක සවි කරන්න.
- තහඩු දෙක අතරට පොලිතින් කොළය තබා තහඩු එකිනෙක ස්පර්ශ නොවන සේ රබර් පටි හෝ සෙලොටේප් මගින් රඳවන්න.
- තහඩු හා සම්බන්ධ වයර දෙක වියළි කෝෂවලට සම්බන්ධ කර සුළු වේලාවක් තබන්න.
- කෝෂ දෙක ඉවත් කර තහඩු හා සම්බන්ධ කළ වයරවලට ගැල්වනෝමීටරය සම්බන්ධ කර ක්ෂණිකව නිරීක්ෂණය කරන්න. (මෙම පියවර ක්ෂණිකව සිදු කළ යුතු ය.)
- නිරීක්ෂණ සඳහා හේතු සාකච්ඡා කරන්න.



2.12 රූපය ▲ සරල ධාරිත්‍රකය



2.13 රූපය ▲ සරල ධාරිත්‍රකය හා වියළි කෝෂ යෙදූ පරිපථයක්

ක්‍රියාකාරකම 2.6

ධාරිත්‍රකයක ආරෝපණය හා විසර්ජන හඳුනා ගැනීම

අවශ්‍ය ද්‍රව්‍ය :- 1000 μF ධාරිත්‍රකයක්, වියළිකෝෂ තුනක්, කුඩා LED එකක්, වයර කැබලි

ක්‍රමය :- ධාරිත්‍රකයේ දෙකෙළවර වයර් කැබලි හා සම්බන්ධ කරන්න. වියළි කෝෂ දෙක නිවැරදි ලෙස ධාරිත්‍රකයේ අග්‍රවලට සම්බන්ධ කරන්න. තත්පර කිහිපයක් තබන්න. ක්ෂණිකව වියළි කෝෂ ඉවත් කර ධාරිත්‍රකයේ අග්‍ර අතරට LED එක සම්බන්ධ කර නිරීක්ෂණ ලබා ගන්න. (බැටරියේ + අග්‍රය සවි වූ පැත්තට LED හි + අග්‍රය සම්බන්ධ කළ යුතු ය)

ඔබේ නිරීක්ෂණ සඳහා හේතු සාකච්ඡා කරන්න.



2.16 රූපය ▲ ධාරිත්‍රකයක් ආරෝපණය හා විසර්ජනය

- ඔබේ පෙළ පොතෙහි 33 පිටුවේ ඇති අභ්‍යාසය සම්පූර්ණ කරන්න.